# අඳිසි

ජගත් ජේ එදිරිසිංහ ලියයි




රණසිංහ බීර වීදුරුව එක හුස්මට අවසන් කර වීදුරුව මේසය මත තබා නැගිටියි.

"යමු.."

සුනන්ද තවමත් දෑස් මේසය මත වූ හිස් බෝතල කීපය දෙසට එල්ල කරගත්වනම ය.

"යමු.." රණසිංහ නැවතත් කියයි.

"බැහැ මහත්තය... මට මහත්තය එක්ක පන්සලට එන්න හිත හදාගන්න බැහැ... ඇත්ත දැන දැන ලොකු හාමුදුරුවන්ගෙ මූණ බලන්ඩ බැහැ මට.."

රණසිංහගේ මුහුණ කලු වන්නේ කෝපය නිසා ය. "පිස්සු කෙළින්න එපා.." ඔහු සුනන්ද වාඩි වී සිටි පුටුවේ ඇන්දට වමතත් මේසය මත දකුණතත් තබා සුනන්ද ගේ මුහුණට පහත්ව කියයි. "..බබා පාට් නොදා හිටපං යකෝ.. උඹ... උඹ විසිහතර පැයේම පිස්තෝලයක් ඉණෝ ගහගෙන ඉන්න පාතාලයෙක්.. මේව උඹට අරුම දේවල් වුණේ කොහොමද..? මගේ යකා අවුස්සගන්න එපා සුනන්ද.."

සුනන්ද සිය දෑස් අසළම දැල්වෙන කෝපයෙන් ගිනිගත් රණසිංහගේ දෑස් දෙස හැඟිමකින් තොරව බලයි. කෝපයක් භීතියක් හෝ වෙන යම්කිසි හැඟීමක් හෝ සිය සිත තුල ජනිත නොවන්නේ මන්දැයි සුනන්දට නොවැටහෙයි. සුනන්දගේ මුවග මතුවෙන සිනහව තේරුම් ගන්නට රණසිහට නොහැකි ය.

"මම කිසිම දාක මගේ පිස්තෝලෙ මිනිහෙකුට එල්ල කරලා පත්තු කරලා නැහැ මහත්තයා.. මහත්තයා ඒක දන්නවා.. මං මගේ අතක් යුක්තිය  යට කරලා දාන්න උස්සලා නැහැ.. ඒකත් මහත්තයා දන්නවා.. මං කිව්ව දෙයක් අම්ම මුත්තෙ කිව්වත් වෙනස් නොකරන මිනිහෙක්.. මහත්තය ඒකත් නොදැන ඉන්න විදිහක් නැහැ.." සුනන්දගේ කටහඬ තැන්පත් ය. එය රණසිංහගේ සිතේ ඇති කරන්නේ විමතියකි. මේ මිනිසා බොහෝ වෙනස් වී ඇත. රණසිංහ සන්සුන් වන්නට උත්සාහ ගනිමින් නැවතත් පුටුවේ වාඩි වෙයි.

"ඊයෙ රෑ පන්සලට බෝම්බ ගැහුවා.. අද උදේ මං මහත්තය හම්බවෙන්න එනකොට ඒක කෙරෙව්වෙ මහත්තයා කියලා මගේ හිතේ තිබුණෙ සැකයක් විතරයි.. ඒ වෙලාවෙ ඒ සැකයේ වාසිය මහත්තයට දෙන්න මට පුලුවන් කම තිබුණා.. ඒත් දැන් එහෙම බැහැ.. දැන් සැකයක් නැහැ.. මහත්තයා තරහ ගන්න එපා.. මේ ගමනෙ ඉතුරු ටික යන්න මහත්තයට මාව ඕනෙ වෙන එකක් නැහැ.."

රණසිංහ මේසය හරහා යතුරු කැරැල්ල රණසිංහ වෙත තල්ලුකර දමයි. මේස ඇතිරිල්ලේ රැලි අතර දැවටී එය අතර මග නවතියි. රණසිංහ එදෙස බලාගත්වනම කල්පනාවට වැටී සිටිණු සුනන්දට පෙනෙයි. දවසේ පළමු වතාවට රණසිංහ ගේ මුහුණින් මතුව එන පරාජිත පෙනුම සුනන්දගෙන් සඟවන්නට නොහැකි ය.

සුනන්ද රණසිංහ වෙතින් දෑස් ඉවතට ගෙන මුහුද දෙස බලයි. මුහුදු රළ බිඳෙන ඝෝෂාව දැන් තවත් වැඩි වී ඇතැයි සුනන්දට සිතෙයි. මුහුදු වෙරළ දිගේ ඇවිද යන කෙසඟ මිනිසුන් කීප දෙනා සුනන්දගේ ඇස ගැටෙයි. ඔවුහු බොහෝ ඉක්මණින් සුනන්දගේ ඇස් මානයෙන් ඉක්මනින්ම ඉවතට යති. දාහතේ වත්තේ ඇල ඉවුර දිගේ දවස පුරා පියමනිමින් සිටින විවිධාකාර වූ මිනිසුන් සුන්නදට සිහිපත් වෙයි. ඒ මිනිසුන්ගේ මුහුණ වල ස්ථිර ලෙස සටහන්ව ඇති පීඩාව මේ මොහොතේත් සුනන්දට මැවී පෙනෙයි.

"සුනා.." මුහුදු රළ හඬ අභිබවා රණසිංහගේ කටහඬ ඇසෙයි. සුනන්ද හිස හරවා ඔහු දෙස බලයි.

"අපි යමු මල්ලි.."

"කොහෙද..?"

"උඹ කැමති දිහාක... " රණසිංහ නැගිටින අතර කියයි. ඔහු සුනන්ද දෙස නොබලා ම හෝටලට දෙසට ඇවිද යයි. සුනන්ද මේසය මත වූ යතුරු කැරැල්ල අතට ගනියි.

00000000

වින්ධ්‍යා කවුලුවේ තිර රෙද්ද මෑත් කර රණසිංහ ගේ කාර්යාලය දෙස බලා සිටියි.

**"ඊයෙ රෑ පන්සලට බෝම්බ ගැහුවා.. අද උදේ මං මහත්තය හම්බවෙන්න එනකොට ඒක කෙරෙව්වෙ මහත්තයා කියලා මගේ හිතේ තිබුණෙ සැකයක් විතරයි.. ඒ වෙලාවෙ ඒ සැකයේ වාසිය මහත්තයට දෙන්න මට පුලුවන් කම තිබුණා.. ඒත් දැන් එහෙම බැහැ.. දැන් සැකයක් නැහැ.. මහත්තයා තරහ ගන්න එපා.. මේ ගමනෙ ඉතුරු ටික යන්න මහත්තයට මාව ඕනෙ වෙන එකක් නැහැ.."**

සති කීපයක සිට මැතිවරණය හා සම්බන්ධ විවිධ කාර්යයන් සඳහා එන යන ගැහැණුන් හා මිනිසුන් නිසා පරිසරය මහත් කලබලකාරී ස්වභාවයක් ගෙන ඇත. මේ කලබලය ඇගේ සිතට මහත් විඩාවකි.

පසුගිය කාලය පුරා වරින් වර රණසිංහ හමුවන්නට යන එන ඡන්ද දායකයන් බොහොමයක ගේ මුහුණු වින්ධ්‍යා ගේ මතකයේ ඇත. නමුත් දැන් දැන් ඇය ඇස ගැටෙන බොහෝ මුහුණු මින් පෙර දැක ඇති බවක් ඇයට නොහැඟෙයි. කිසියම් නොදන්නා හේතුවක් නිසා රණසිංහ වටා පෙළ ගැසෙන මේ අලුත් පරපුර පිළිබඳ පැහැදීමක් ඇගේ සිතේ ජනිත නොවෙයි.

මෙසේ පිරෙණ සෙනග අතරේ කඩියකු සේ දුව පැන ඇවිද ගිය සුනන්ද නැති අඩුව තදින් කැපී පෙනෙයි. ඉඳ හිට කාර්යාලයට ගොඩ වැදී යන සුනන්ද පෙර සේ සංවිධාන කටයුතු හා සම්බන්ධ නොවන බව වින්ධ්‍යා දනියි. සුනන්ද ගේ අඩුව මකන්නට අජිත්ට හෝ දැන් මෙහි ප්‍රධාන චරිතයක් බවට පත්වෙමින් සිටින ඔහුගේ සොහොයුරියට හෝ නොහැකි බව වින්ධ්‍යාට පැහැදිළි ය. අජිත් ගේ සොහොයුරිය ගේ නම අයෝමා බවත් ඇය හෙට අනිද්දා විශ්ව විද්‍යාලයෙන් පිටවන උපාධිධාරිණියක බවත් කවුරුන් හෝ තමාට කී බව ඇයට මතක ය. ඇය මෙතරම් ඉක්මණින් මේ වැඩ කටයුතු හා සමීප වීම වින්ධ්‍යාට පුදුමයකි. අහසින් කඩා වැටුණා සේ ය. ඇගේ උගත් කමින් යම් ප්‍රයෝජනයක් ගන්නට රණසිංහ සිතන්නට ඇතැයි වින්ධ්‍යා අනුමාන කරයි.

වෙනත් කලෙක නම් රණසිංහ හා උරෙනුර ගැටී වැඩ කරන අයෝමා දකින විට සිය සිත පෑරෙනු ඇති බව වින්ධ්‍යාට සහතික ය. නමුත් දැන් එවැනි හැඟීම් වලට සිය සිත තුළ ඉඩක් නැති වීම සහනයකි. නන්නාඳුනනා ගැහැණියක හා මිනිසකු දෙසා බලා සිටින්නාසේ ඒ දෙස බලා සිටින්නට දැන් ඇයට හැකි ය.

රණසිංහ ගේ ඡන්ද ව්‍යාපාරය සඳහා නාමිකව හෝ පෙනී නොසිටින්නෙමැයි ඇය අදිටන් කරගෙන සිටියි. මේ අප්‍රසන්න පරිසරය හා තව තවත් බද්ධ නොවිය යුතු ය. ඉන්නා ටික කාලයේ දී හෝ මේ පරිසරයට පරිබාහිර සත්වයකු ලෙස ජීවත් විය යුතු ය.

නළා හඬ නංවමින් වාහන පෙළක් වත්තට ඇතුල් වෙයි. ඒ ප්‍රඥාරත්න ඇමතිවරයා ගේ වාහන විය යුතු ය. ඔහු දැන් වරින් වර රණසිංහ ගේ කාර්යාලයට එයි. එන්නේ සංවිධාන කටයුතු විපරම් කිරීම සඳහා යයි කීවද එවැන්නක් වින්ධ්‍යාට නොපෙනෙයි. පැමිණෙන වාර ගණනද එන්න එන්නම වැඩි වන සෙයකි. එසේ පැමිණෙන සෑම අවස්ථා-වකදීම ඔහු අයෝමා සමග ඉතා කුළුපගව කතා බහ කරනු වින්ධ්‍යාට පෙනෙයි. සංවිධාන කටයුතු පිළිබඳ බොහෝ කරුණු කාරණා ප්‍රඥාරත්නට තේරුම් කර දෙන්නේ අයෝමා ය. වයසක ඇමතිවරයාගේ බැල්මේත් සිනාවේත් සැඟවුණ අරුත් ඇති බව වින්ධ්‍යා සිතයි.

වින්ධ්‍යා ජනේලය අසළින් මෑත්ව කාමරයට යයි. කාර්යාලය දෙසින් ඇසෙන ප්‍රඥාරත්න ගේ ගොරහැඩි සිනාව කාමරයටත් ඇතුල් වෙයි. කොට්ටයක් නළල මත තබාගන්නා වින්ධ්‍යා සිත සන්සුන් කරගන්නට උත්සාහ කරයි. හැකි ඉක්මණින් නුවර යා යුතු යයි ඇගේ සිත කියයි.

0000000

ලොකු හාමුදුරුවන් සිටින්නේ මහත් කැළඹුණ සිතින් ය. උදෑසන ගිලන්පස පූජා කරන්නට ආ දායකයන් සමගවත් උන් වහන්සේ හරි හැකි කතා නොකළේ යයි පොඩි හාමුදුරුවන්ට සිතෙයි. මේ පොරයට වැටෙන්නට පෙර ලොකු හාමුදරුවන් කෙතරම් ප්‍රබෝධයකින් සිටියේදැයි සිහිපත් වන විට පොඩි හාමුදරුවන් සිතේ ඇති වන්නේ මහත් කණගාටුවකි. වයස්ගත ලොකු හාමුදරුවන් මේ අනවශ්‍ය පොරයකට දායක කර ගැනීමෙන් පඤ්ඤාසීහ හාමුදුරුවන් සහ ජිනරතන හාමුදුරුවන් කළේ නොකටයුත්තකි.

බෝම්බ ගැසීමේ සිද්දිය යටපත්ව යමින් තිබෙයි. පොලීසිය ද නිහඬ ය. දෙතුන් වතාවක් පන්සලට පැමිණ ගියායින් පසු ඔවුන් සියලු පරීක්ෂණ නිමා කළා සේ ය. වරින් වර පැමිණෙන තර්ජනාත්මක දුරකතන පනිවිඩ තවමත් නැවතී නැත. ඒවා අසා සිටින්නට ලොකු හාමුදුරුවන්ට ශක්තියක් නැත.

රණසිංහ මන්ත්‍රීවරයා ඊයේ සවස පන්සලට ආවේ ආයෝමා ද සමගින් ය. ඔවුන් බොහෝ වේලාවක් සාකච්ඡා කරමින් සිටිය ද එයට ඇහුම්කන් දෙන්නට පොඩි හාමුදරුවන්ට නොහැකි විය. බොහෝ ගරු සරු ඇතිව නමුත් ඔවුන් යම්කිසිවකට ලොකු හාමුදුරුවන් පොළඹවා ගන්නට උත්සාහ කළ බව උන්වහන්සේ අනුමාන කරති.

මහ ගේට්ටුව දෙසින් සෙදෝරිස්ගේ කටහඬ ඇසෙයි. පොඩි හාමුදුරුවෝ තිසල් පාඩම් කරමින් සිටින මේසය ඉදිරියෙන් ඇති කවුළුව තුළින් එදෙස බලති.

පන්සල් වත්තට ලොරියක් ඇතුල් වෙයි.

"ලොරියක්....?"

"එකක් නෙවෙයි හාමුදුරුවනේ.. අන්න තවත් එකක් පස්සෙන් එනවා.." තිසල් පාඩම් පොත වසා දමයි.

"ගඩොලුයි වැලියි හාමුදුරුවනේ.." සෙදෝරිස් කවුලුව අසළටම පැමිණ කියයි. "... මොනාටද අපේ හාමුදුරුවනේ..?"

"මාත් දන්නෙ නැහැනෙ සෙදෝරිස් උන්නැහේ" යයි කියන්නට සිතුණ ද පොඩි හාමුදුරුවෝ ඒ සිතුවිල්ල බැහැර දමති. "ගිහින් ලොකු හාමුදුරුවන්ට කිව්ව නම්.."

පිටුපස තට්ටුව ඔසවා වැලි තොගය බිමට අතහරින එක් ලොරියක් මහ ගේට්ටුවෙන් ඉගිල යයි. ලොරියේ රළු ගමන විසින් අවුස්සන ලද දූවිලි වලාව මැදින් රණසිංහ ගේ ප්‍රාඩෝව පන්සල් මිදුලට ඇතුල් වෙයි. එහි වම් අත ඉදිරි
අසුනේ වාඩිව සිටින්නේ අජිත් බව තිසල් සැනෙකින් හඳුනා ගනියි. මුලින්ම වාහනයෙන් බසින්නේ අජිත් ය. ඔහු විසින් අරින ලද පසුපස දොරෙන් රණසිංහ බිමට බසින්නේ සිනාසීගත්වනම ය. එක වරම ආවාසය දෙසට නොපැමිණෙන ඔහු කඩිසර ලෙස ගඩොල් බිමට බාමින් සිටින මිනිසුන් දෙදෙනා අසළට ගොස් යමක් කියයි. සෙදෝරිස් ඒ අසළ කැරකෙන්නේ රණසිංහ ගේ වචන වලින් යමක් අසුලාගන්නට ය.

"ඔන්න අපේ හාමුදුරුවනේ අපි වැඩ පටන් ගත්තා.. ඉස්සෙල්ලාම තාප්පෙ.. ඒක ඉවර කරලා අපි බණ මඩුවත් රෙපයාර් කරමු... මං හිතාන ඉන්නෙ වහලෙ උලු ටික අලුතින්ම දාන්ඩ... " රණසිංහ ආවාසයට ගොඩ වන්නටත් පෙර කියයි. ".. අපේ පන්සලේ දියුණුව වෙනුවෙන් මට කරන්න පුලුවන් හැම දෙයක්ම මං කරනවා අපේ හාමුදුරුවනේ.."

24 වන පිටුවට